2019 – 04 -29 වෙනි දින ඕක්ලන්ඩ් ශ්‍රී ලංකාරාමයේදී සිදුකළ දේශනය.

අපි මේ පින්වතුන්ට ඉස්සෙල්ලා මතක් කරලා දුන්නා අස්සාද සූත්‍රය කියලා එකක්. ඒකෙ කරුණු ටික මතක තිබෙන්න ඕනෑ. ඊට කලියෙන් මම ඊයේ කියපු කොටසට වැදගත් වෙන කාණ්ඩයක් කියලා දෙනවා. ඒක හරි පරිස්සමින් හිතේ දරා ගන්න, හේතුව, අපි පොඩි පොඩි ගාථා වලට පුරුදු වෙච්ච ජන කොටසක්. ඒ කියන්නේ 'කරණීය මෙත්ත සූත්‍රය' 'මංගල සූත්‍රය' වැනි ගාථා ටිකකට හුරු වෙච්ච ගාථා ටිකකම රැදිලා හැඩ ගැහිච්ච ජන කොටසක්. ඊළඟට ඒක හිතන්න කවුරුවත් උගන්නලත් නෑ. ඕකේ අඩුපාඩුව තිබෙනවා. ඒක නිසා එක්තරා කාලයකට හුරුවෙලා තිබෙන හිත ඒවාගෙන් එහාට යන්න ගියහම හැප්පෙනවා වගේ වෙනවා. දැන් පංචස්කන්ධය මොකක්ද කියලා කියන්න කිව්වහම අපේ අය කියනවා රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියලා. ඒ වචන පහක්. ඕක සාමාන්‍යයෙන් අපි පොඩි ළමයෙකුට කිව්වොත් ඒ ළමයත් ඕක කියනවා. හැබැයි රූප වේදනා සංඥා සංඛාර යනු කුමක්දැයි කියලා කියලා දෙන්න ගියහම තමයි අපිට information නැත්තේ. ඒක නිසා ඒකත් විශේෂයෙන් අපි දැනගන්න ඕනෑ.

මම මේ ටික කියලා දෙන්නම්. මේක උදාහරණයක්. මේ අපිට ලැබිලා තිබෙන මේ current මොකේද තිබෙන්නේ? මේ මහත්තයා කියනවා current එක තිබෙන්නේ වයර් ඒකේ කියලා. Current එකයි වයර් එකක්ද දෙකක්ද? දෙකක්. එතකොට ඒක දෙකක් නම් ඇයි current එක අපිට වෙනම ගන්න බැරි. අපිට ප්‍රයෝජනවත් වෙන්නේ current එකද? වයර් එකද? අපිට ප්‍රයෝජනවත් current එක. එතකොට current එක ප්‍රයෝජනවත්ව තිබෙද්දී ඇයි අපි වයර් හයි කරන්නේ? ඒ කියන්නේ ඒක ඇදගන්න මාර්ගයක් ඕනෑ. වයර් එකක් නැත්නම් current ඒකේ ගමනක් නෑ. එතකොට විදුලිය කියන දේට ගමන් කරන්න රැදෙන්න තිබෙන මාධ්‍යය තමයි වයර් එක. අපි එතකොට හොඳට තේරුම් ගන්න ඕනෑ වයර් එක වෙනයි current එක වෙනයි කියලා.

දැන් current එක එකක් - වයර් එක එකක්. දැන් වයර් එක දිගේ current එක ගිහිල්ලා මොකක් හරි දෙයක් සිද්ධ කරනවා. අපි හිතමු බල්බ් එකක් පත්තු කරනවා කියලා. එහෙම නැත්නම් fan එකක් කරකවලා දෙනවා කියලා. එතකොට ඒ fan එක ක්‍රියාත්මක වීමයි කියලා කියන එකයි, current එකයි, වයර් එකයි කියන්නේ එකක්ද තුනක්ද? දැන් විදුලිය නැතුව fan එක තිබෙනවා. එතකොට කරකැවෙන්නේ නෑ. එතකොට කැරකීම කියලා කියන්නේ ක්‍රියා වලියක්. දැන් ඔය fan එක කැරකෙන එක කරන්න කවුද එන්නේ? විදුලිය. එතකොට විදුලිය වෙනයි, fan එක කරකැවෙන එක වෙනයි. එතකොට Fridge එක ක්‍රියාත්මක වීමයි විදුලියයි කියන්නේ දෙකක්ද? එකක්ද? දෙකක්. විදුලියේ බලයෙන් තමයි ක්‍රියාත්මක වෙන්නේ, අපි පටලවා ගන්න හොඳ නෑ, විදුලියේ බලයෙන් ක්‍රියාත්මක උනාට විදුලියයි ක්‍රියාත්මක වීමයි කියලා කියන්නේ දෙකක්.

ඊළඟට අපි ලයිට් පත්තු කරනවා. දැන් අපි මේ ලයිට් කියලා කියන්නේ විදුලියද? නෑ. දැන් මේක විදුලිය නම් අපි පිච්චෙන්න ඕනෑ. නමුත් 'ආලෝකයයි' 'විදුලියයි' 'වයර් එකයි' කියලා කියන්නේ ධර්මතා තුනක්. 'වයර් එකයි' 'විදුලියයි' 'fridge එකයි' ධර්මතා තුනක්. මේක පැහැදිලියිද? යම්කිසි උපමාවක් කියලා දෙන්නේ උදව්වක් හැටියටයි. ඒක භාෂාවක්. උපමාව හොඳට ග්‍රහණය කරගන්න ඕනෑ. ග්‍රහණය කර ගත්තේ නැත්නම් අනිත් ඒවා ගන්න බෑ. ඕක හිතේ තියා ගන්න.

අපි කියනවා **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා කියනකොට අවිද්‍යාව නිසාලු සංස්කාර හැදෙන්නේ. එතකොට අවිද්‍යාව විතරද හිතේ පහළ උනේ? නෑ, අවිද්‍යාව විතරක් නොවේ. තව තණ්හාව තිබෙනවා. කර්ම තිබෙනවා. දැන් සංස්කාර හටගත්තේ අවිද්‍යාව නිසා කියල කියනවා. ඒක රහසක් නොවෙයි. එතකොට අපි හිතන්න ඕනෑ සංස්කාරයන් හටගැනීමට අවිද්‍යාව හේතු උනානම් අවිද්‍යාව විතරමද හේතු උනේ කියලා. අවිද්‍යාව විතරමද එතැන තිබුණේ කියලා. අවිද්‍යාව තනියම හුදෙක් පහළ වෙන්න පුළුවන්ද? අවිද්‍යාවට පමණක් හුදෙක් තනියම පහළ වෙන්න බෑ. අවිද්‍යාව කියලා කියන්නේ චෛතසික ධර්මයක්. චෛතසික ධර්ම තනියෙන් පහළ වෙන්නේ නෑ. අවිද්‍යාවේ ගතිය

තමයි සත්‍යය නොදැකීම. අවිද්‍යාවත් සමග හිත පහළ වෙනවා. මේ හිතේ තව තිබෙනවා 'තණ්හාව' 'ඵස්ස' 'වේදනා' 'සංඥා' 'චේතනා' වශයෙන් තව ධර්ම ගොඩක් තිබෙනවා. 'හිතයි' 'චෛතසිකයි' ඔක්කොම එක මණ්ඩලයක්. කවදාකවත් හිතක් පමණක් තනිකර පහළ වෙන්නේ නෑ චෛතසික නැතුව. චෛතසික විතරක් තනිකර පහළ වෙන්නේ නෑ හිතක් නැතුව. ඒක නිසා හිතයි චෛතසිකයි ඔක්කොම එක පිණ්ඩයකට, ගුලියකට පහළ වෙන්නේ. නමුත් කථාවේදී අපි ඒක කියන්නේ නෑ. ඒක නිසා හරි ප්‍රශ්නයක්. අපි කියන්නේ හිතක් පහළ උනා කියලා. හිත පහළ උනා කියලා කිව්වට අපි දැන ගන්න ඕනෑ ඒ හිතේ චෛතසිකත් පහළ වෙලා තිබෙනවා කියලා. ඊළඟට මේකේ **අවිද්‍යාව** තමයි ප්‍රධාන. දැන් එතකොට හොඳටම පැහැදිලියි මේ ඔක්කොම එකටයි පහළ උනේ කියලා. මේකේ අවිද්‍යාව තමයි ප්‍රධාන. දැන් මෙතැන කථාව කියන්නේ **අවිජ්ජා පච්චයා සංඛාරා** කියලා. මෙතැන ගොඩක් චෛතසික තිබුණට අවිද්‍යාව විතරලු සංඛාර හැදෙන්න හේතු වෙන්නේ. සංඛාර කියලා කියන්නේ 'චේතනාව' .

දැන් කර්ම රැස් කරන වෙලාවේදී තමයි සංඛාර පහළ වෙන්නේ. ඊළඟට ඒ සංඛාර පහළ වෙන්න අවිද්‍යාව හේතු වෙනවා. හැබැයි එතකොට ප්‍රශ්නයක් එනවා ඇයි මේ හිත හේතු උනේ නැත්ද කියලා. දැන් මෙතැන මේ ධර්ම සම්භාරයක් තිබෙත්දී සංඛාර සැදීමට අවිද්‍යාව විතරද හේතු උනේ? මෙතැනදී **අවිජ්ජා පච්චයා සංඛාරා** කියලා කියන සංස්කාර හදන වැඩේට විශේෂ බලය තිබෙන්නේ මේ අවිද්‍යාවටයි.

දැන් මේ වයර් එකක තිබෙනවා බර ගතියක්. පාටක් තිබෙනවා. gauge එකක් තිබෙනවා. තව cover එකක් තිබෙනවා. ඒවා ඔක්කෝම එකතු කරලා තමයි වයර් එක කියන්නේ. ඊළඟට තව switch තිබෙනවා. ඔය මොනවා තිබුනත් ඒ විදුලිය යන්නේ එක තැනකින් විතරයි. කම්බි කැල්ලේ විතරයි. ආන්න ඒ වගේ තව මොන සම්භාරයක් තිබුණත් එක තැනක **අවිද්‍යාව** ප්‍රධාන වෙනවා, ප්‍රධාන කාරණයක් **චේතනාව** ක්‍රියාත්මක කරන්න. අනිත් ඒවා ප්‍රධාන නැති නිසයි කියන්නේ නැත්තේ. හිතත් තිබෙනවා, තණ්හාවත් තිබෙනවා, චේතනාවත් තිබෙනවා. නමුත් ප්‍රධනම කාරණය තමයි අවිද්‍යාව. **අවිද්‍යාව** නිසා තමයි **චේතනාව** හෙවත් **සංස්කාර** පහළ වෙන්නේ.

අපි අරමුණක් දකිනකොට ඒක දැනගන්නේ මොකෙන්ද? අරමුණ දැන ගන්නේ සිතෙන්. සිත කොහොමද පහළ වෙන්නේ? අපේ හිත ක්‍රියාත්මක වෙනකොට කරුණු තුනක් වැඩ කරනවා. එකක් තමයි හිත තිබෙන තැනක් තිබෙන්නේ ඕනෑ. හිත කියන්නේ එකක්. හිත පහළ වෙන තැන එකක්. කෑම කියන්නේ එකක්. කෑම තිබෙන භාජනය එකක්. තේ කියන්නේ එක ජාතියක්. තේ වක්කරලා තිබෙන කෝප්පය තව එකක්. හැබැයි අපි තේ කෝප්පෙට දැම්මට කෑම පිඟානට දැම්මට පිඟානට නොවෙයි කෑම අවශ්‍ය. කෝප්පෙට නොවෙයි තේ අවශ්‍ය. නමුත් කෝප්පය කියන්නේ තේ තිබෙන එකක්. පිඟාන කියන්නේ කෑම තිබෙන එකක්. හැබැයි ඒ පිඟානේ තිබෙන්නා වූ කෑම පිඟානට නොවෙයි, ඒක කන කෙනාටයි. එතකොට කෝප්පයේ තිබෙන තේ කෝප්පෙට නොවෙයි, ඒක බොන කෙනාටයි. දැන් වයර් එකේ current එක තිබුණට ඒක වයර් එකට නොවෙයි අවශ්‍ය.

ඒ වගේ මේ අපේ ඇඟ වෙනස්. හිත වෙනස්. එතකොට මේ ඇඟ වෙනයි හිත වෙනයි. ඒක නිසා තමයි යම්කිසි අවස්ථාවකදී මේ ඇඟ අතහැරලා හිත අහකට යන්නේ. එතකොට මේ හිත current එක වගෙයි. මේ හිත තිබෙන්නේ අහසේ නොවෙයි. මේ හිත තිබෙන්නේ ශරීරය ආධාර කරගෙන. ශරීරය පිඟාන වගේ කරගෙන. නමුත් මේ හිත කියන එක ශරීරය ආශ්‍රය කරගෙන තිබුණට එයාට ඕනෑ අරමුණු දැනගන්න. ඒක නිසා 'ඇස' 'කන' 'නාසය' 'දිව' 'ශරීරය' කියන මේ ස්ථාන මුල් කරගෙන මේ හිත වෙන වෙන දේවල් දකිනවා. වෙන වෙන දේවල් අහනවා. ගඳ සුවඳ දැන ගන්නවා. රස දැන ගන්නවා. ස්පර්ශ කරනවා. මේ ඇහැ කියන එක අපිට කිසිසේත්ම වැඩක් නෑ ඇහැ නැතුව රූප බලාගන්න පුළුවන් නම්. හේතුව, ඇහෙන් නොවෙයි අපි රූප බලන්නේ. අපි රූප බලන්නේම සිතෙන්. හැබැයි සිතෙන් රූප බලනවා කියලා අපි ප්‍රකාශ කරන්නේ නෑ. ප්‍රකාශ කරන්නේ නැතුව ඇසෙන් රූප බලනවා කියලා අපි කථා කරනවා. කවදාකවත් කනින් නොවෙයි සද්දය අහන්නේ. සද්දය අහන්නේ සිතෙන්. ඒ උනාට කවදාකවත් අපි කියන්නේ නෑ සිතෙන් සද්ද අහනවා කියලා. නාසයෙන් කවදාකවත් ගඳ සුවඳ දැන

ගන්න බෑ. හේතුව, නාසයට ගඳ සුවඳ දැන ගැනීමේ හැකියාව නෑ. ඒවගේම දිවෙන් රස දැන ගැනීමේ හැකියාවත් නෑ. හිතෙන් තමයි රස දැනගන්නේ. සිතෙන් තමයි ස්පර්ශය දැන ගන්නේ. නමුත් මේ ඇසයි කනයි නාසයයි දිවයි ශරීරයයි කියලා කියන්නේ සිතට වැඩ කරන්න ස්ථාන පහක්. හැබැයි ඇහැ නොවෙයි හිත, හිත නොවෙයි ඇහැ. හිතට ඕනෑ යම්කිසි රූපයක් බලන්න. නමුත් ඇහැ පියාගෙන බලන්න බෑ. ඒක නිසා මේ හිත ඇහැ ගාවට යනවා. ඇහැ ගාවට ගිහිල්ලා ඒකෙ තැවරීගෙන ඒක උඩ ඉඳගෙන තමයි රූපයක් දිහා බලන්නේ. මේක තේරෙනවද?

සද්දය අහන්න බෑ කෙලින්ම හිතට. ඒක නිසා හිත කනගාවට ගිහිල්ලා කන උඩ ඉඳගෙන තමයි සද්දය අහන්නේ. නමුත් අපි කියන්නේ කනට ඇහුනා කියලා. හැබැයි ඇහුනේ සිතටයි. නාසයට ගඳ සුවඳ දැනෙන්නේ නෑ. හිත යනවා නාසය ගාවට. නාසය ගාවට ගිහිල්ලා තමයි හිත ගඳ සුවඳ දැනගන්නේ. රස දැනගන්නෙත් ඒ විදියටයි. ස්පර්ශය දැන ගන්නෙත් ඒ විදියටයි. අපි තේරුම් ගන්න ඕනෑ මේක දෙකක් කියලා.

ඊළඟට තව එකක් තිබෙනවා. දැන් ඇස ගාවට යනවා හිත. ඇසේ පිහිටලා ඇසේ අඩිය ගහගෙන ඇසේ ඉඳගෙන රූපයක් බලනවා ඒ හිත. හිත රූපයක් බලනකොට ඒ රූපය පේන්නෙ කාටද? හිතටයි පේන්නෙ. එතකොට ‘හිතටත්’ ‘ඇසටත්’ අමතරව තවත් එකක් නේද ‘රූපය’ කියලා කියන්නේ? ඒකට කියනවා ආරම්මණය කියලා. දැන් එතකොට මෙතැන කරුණු එකක්ද? දෙකක්ද? තුනක්ද? තුනක්.

ඒවගේම හිත කනගාවට ගිහිල්ලා කන උඩ ඉඳගෙන අහනවා සද්දයක්. නමුත් අපි කියන්නේ කනට සද්දය ඇහුනා කියලා. ඇත්තටම සද්දේ ඇහුනේ කනටද? නෑ, සිතටයි ඇහුනේ. එතකොට ඒ සද්දය එකක්. කන එකක්. ඒක දැන ගත්ත හිත එකක්.

මේ කාරණා වලට අපි නම් ටිකක් කියනවා. දැන් හිත කොහේ හරි අභ්‍යන්තරයක තිබෙනවා. එහෙම තිබෙන තාක් කල් මේකට දකින්න බලන්න බෑ. ඒක නිසා හිත යනවා ඇස ගාවට. දැන් ඇහැ තිබුණා කියලම රූප පේන්නෙ නෑ. ඇහැ ඇරගෙන නිදාගත්තොත් රූප පේනවද? පේන්නෙ නෑ. ඇයි? එතන හිත නැති නිසා. ඒක නිසා නින්දෙන් ඇහැරිලා සිත එන්න ඕනෑ ඇස ගාවට. ආපු ගමන් තමයි හිතට රූපය පේන්නෙ. ඒක නිසා හිතයි රූපයයි ඇසයි කියන්නේ ධර්මතා තුනක්. හිතට කියනවා විඤ්ඤාණය කියලා. හිත කියන එක පේන්නෙ නෑ. ඒක current එක වගේ. නමුත් ඇස පේනවා, රූපය පේනවා.

දැන් මේ විඤ්ඤාණය (හිත) එනම් දැන ගැනීමේ ශක්තිය හෙමිහිට ගොඩවෙනවා ඇසට. ගොඩ උනාට පස්සේ ඒ ‘හිතට’ පේනවා ‘ආරම්මණය’. ඒක නිසා විඤ්ඤාණය ගිහිල්ලා පා තබන තැනට කියනවා ‘වස්තුව’ කියලා. ඒ කියන්නේ පිහාන වගේ, කෝප්පය වගේ තැනක්. ‘විඤ්ඤාණය’ සහ ‘වස්තුව’ කියන්නේ දෙකක්. මේ ධර්ම භාෂාවේ ‘වස්තුව’ කියන එකට ‘වස්තු රූපය’ කියලා කියනවා, ප්‍රසාදය කියලා කියනවා ‘ප්‍රසාද රූපය’ කියලත් කියනවා.



මේ හිත ප්‍රසාදය ළඟට ගියාට ඒ හිතට ප්‍රසාදය පේන්නෙ නෑ. නමුත් ඒ හිතට (විඤ්ඤාණයට) පෙනේනේ එතනින් බාහිරව තිබෙන වෙන රූපයක්. ඒකට කියනවා ආරම්මණය කියලා.

තවත් එකක් තමයි, කැමරාවක් තිබෙනවා. ඒ කැමරාවේ තිබෙනවා යම්කිසි රූපයක් ග්‍රහණය කරගැනීමේ ගුණයක්. ඒ ගුණය තිබෙන්නේ කැමරාව ඇතුලේ. නමුත් කැමරාව ගත්ත ගමන්ම පින්තූර වැටෙන්නේ නෑ. ඒ කැමරාව හරියට focus කරලා එක රූපයකට aim කරන්න ඕනෑ. එතකොට තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. එතකොට කැමරාව එකක්. ඒකෙ රූප capturing ability එක වෙන එකක්. ඒකට වදින රූප තවත් එකක්. දැන් තේරෙනවද මෙතන කරුණු තුනක් කියලා? මේ කැමරාව බෑග් එකේ දාගෙන ගියාට ඒකෙ තිබෙන දේවල් වදින්නේ නෑ. කැමරාව තිබුණට ආලෝකය වැටිච්ච රූපයක් නැත්නම් අඳුරේ තිබුණට ඒත් වැඩක් නෑ. ඒක නිසා රූපය එකක්. රූපය ලබා ගැනීම එකක්. ඒ ලබා ගැනීමේ ශක්තිය තිබෙන්නේ කැමරාව ආශ්‍රය කරගෙනයි. ඒවගේ තමයි **'විඤ්ඤාණය'** එකක්. **'වස්තුව'** එකක්. **'ආරම්මණය'** තවත් එකක්.

1) චක්ඛු විඤ්ඤාණය කියලා කියන්නේ රූප දැන ගැනීමේ හැකියාව.
2) සෝත විඤ්ඤාණය කියලා කියන්නේ සද්ද දැන ගැනීමේ හැකියාව.
3) ඝාණ විඤ්ඤාණය කියන්නේ ගඳ සුවඳ දැන ගැනීමේ හැකියාව.
4) ජිව්හා විඤ්ඤාණය කියලා කියන්නේ රස දැන ගැනීමේ හැකියාව.
5) කාය විඤ්ඤාණය කියලා කියන්නේ ස්පර්ශය දැන ගැනීමේ හැකියාව.

දැන් හොඳට බලන්න හැකියාවල් පහක් තිබෙනවා. දැනීම් වර්ග පහක්. මේක පරෙස්සමෙන් තේරුම් ගන්න. අපි ඉස්සෙල්ලා කිව්වා කෑම බෙදන්නේ පිඟානටයි - තේ දාන්නේ කෝප්පෙටයි කියලා.

දැන් මෙතැන 'ඇස' 'කන' 'නාසය' 'දිව' 'ශරීරය' කියලා තිබෙනවා වස්තු පහක්. හිතලා බලන්න අපි පිඟානට බත් දාගන්නවා කෝප්පයට තේ දාගන්නවා. හැබැයි ඕන උනොත් කෝප්පෙට බත් දාගෙන කන්නත් පුළුවන්. වැඩේ අමාරුයි ඒ උනත් හැබැයි බැරි වෙන්නෙත් නෑ.

දැන් හිතලා බලන්න එක දවසක 'ඇස' රිදෙන්න පටන් අරගෙන ළඟම ඉන්න 'කනට' කියනවා රූපයක් බලන්න උදව් කරන්න කියලා. නමුත් 'කනට' එහෙම කරන්න බෑ. ඒක නිසා මේ චක්ඛු විඤ්ඤාණයට යන්න පුළුවන් කම තිබෙන එකම එක වස්තුව තමයි ඇස (චක්ඛු ප්‍රසාදය) විතරයි. ඒක නිසා චක්ඛු විඤ්ඤාණයට කියනවා නියත දොරටුවක් ඇති එකක් කියලා. නියත දොරටුව කියලා කියන්නේ මොකක්ද? නියත වස්තුව කියන එක. ඒක නිසා කියනවා **චක්ඛු විඤ්ඤාණය නියත වස්තුවක් ඇතුව ක්‍රියාත්මක වෙන දෙයක් කියලා.**

ඊළඟට සෝත විඤ්ඤාණය. මේ සෝත විඤ්ඤාණයටත් නාසයට යන්නත් බෑ. දිවට යන්නත් බෑ. කයට යන්නත් බෑ. ඇසට යන්නත් බෑ. **සෝත විඤ්ඤාණයට ඒකටම අදාළ වෙච්ච වෙනම වස්තුවක් තිබෙනවා.**



දැන් මේ මහත්තුරු දාන කළු coat එකක් තිබෙනවා නේද? ඒ කළු coat එක මරණ ගෙදරටත් දානවා, meeting වලටත් දානවා, රස්සාවටත් අඳිනවා. ඒක මගුල් ගෙදරටත් දානවා. ඒකට කියනවා 'අනියත coats' කියලා. අනියත coats කියලා කියන්නේ ඕනෑම එකකට දාන්න පුළුවන් නිසා.

හැබැයි සමහර ඒවා තිබෙනවා එහෙම බෑ. ඒකට උදාහරණයක් කියන්නම්. ඒ තමයි අර කාන්තාවෝ දාන වෙල් එක. ඒ වෙල් එක දාගෙන කවුරුවත් මළ ගෙදරක ගිහිල්ලා දැකලා තිබෙනවද? එහෙම නැත්නම් කවුරු හරි මීටර් 100 දුවන ඒවාට ගිහින් තිබෙනවාද? සාමාන්‍යයෙන් එහෙම කරන්නේ නෑ. ඒක නිසා ඒ වෙල් එක නියත දෙයක්. Coat එක අනියත එකක්. දැන් කණ්ණාඩියක් පාවිච්චි කරනකොට ඒක දාන්නේ ඇහේ. ඒක කනේ දාන්නේ නෑ. නමුත් මිනිස්සු ඔලුවේ දානවා. මේකෙන් තේරුම් ගන්න ඕනෑ සෝත විඤ්ඤාණය කියලා කියන්නේ **නියත වස්තුවක්** ඇති දෙයක්.

ඝාණ විඤ්ඤාණය කියන එකත් එහෙමයි. කවදාකවත් මේ ඝාණ විඤ්ඤාණයට ඇසට කිට්ටුයි කියලා ඒ හරියට ගිහිල්ලා ගඳ සුවඳ දැන ගන්න බෑ. ඒක නිසා **ඝාණ විඤ්ඤාණයත් නියත වස්තුවක්** ඇති දෙයක්.

ඊළඟට ජිව්හා විඤ්ඤාණයට කවදාකවත්ම නාසය පැත්තට ගිහිල්ලා රස දැනගන්න බෑ. ජිව්හා විඤ්ඤාණය දිව හරියෙම තමයි පහළ වෙන්නේ. ඒක නිසා **ජිව්හා විඤ්ඤාණයත් නියත වස්තුවක් ඇති දෙයක්.**

ඊළඟට කාය විඤ්ඤාණය. කාය විඤ්ඤාණයට කන ගාවට ගිහිල්ලා දැන ගන්නත් බෑ. ඇස හෝ වෙන කිසියම්ම තැනකින් දැන ගන්න බෑ. ඒක නිසා කාය විඤ්ඤාණය පහළ වෙන්නෙම ශරීරයේ. ඒක නිසා **කාය විඤ්ඤාණයත් නියත වස්තුවක් ඇති දෙයක්.**

මේක බොහොම ගැඹුරුයි. මම පුළුවන්තරම් simplify කරලා දෙන්නේ පොඩ්ඩක් ඔලුවේ වද්ද ගන්න.

- **මේ චක්ඛු විඤ්ඤාණයට කවදාකවත්ම සද්දයක් අහන්න බෑ. ඒක නිසා ඒකට පේන්න නියම වෙච්ච අරමුණක් තිබෙනවා. ඒකට කියනවා නියත ආරම්මණය කියලා.**



- **ඊළඟට තිබෙනවා සද්දය. සෝත විඤ්ඤාණයට නියත අරමුණ = සද්දය.**



- **ඝාණ විඤ්ඤාණයට නියත අරමුණ = ගඳ සුවඳ.**



- **ජිව්හා විඤ්ඤාණයට නියත අරමුණ = ‘රස’**



- කායවිඤ්ඤාණයට නියත අරමුණ ‘සපර්ශය ‘



දැන් තේරෙනවා නේද චක්ඛු විඤ්ඤාණයට අදාළ වෙච්ච තැනකුත් තිබෙනවා. ඒකට ගන්න පුළුවන් අරමුණකුත් තිබෙනවා කියලා. සෝත විඤ්ඤාණයත අදාළ වෙච්ච තැනකුත් තිබෙනවා ඒවගේම ඒකටම වෙන් වෙච්ච අරමුණකුත් තිබෙනවා. ඝාණ විඤ්ඤාණයටත් නියත වස්තුවක් තිබෙනවා. නියත වෙච්ච අරමුණක් තිබෙනවා. ජිව්හා විඤ්ඤාණයට නියත ස්ථානයක් තිබෙනවා. නියත අරමුණක් තිබෙනවා. කාය විඤ්ඤාණයට නියත වෙච්ච තිබෙනවා. නියත වෙච්ච අරමුණක් වස්තුවක් තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> = ස්වාමීන්වහන්ස චක්ඛු විඤ්ඤාණයට නියත අරමුණක් තිබෙනවා කිව්වේ වර්ණ රූපයද?

<u>පිළිතුර</u> = ඔව්, වර්ණය තමයි.

මේකේ තවත් එකක් තිබෙනවා. ඒ තමයි ක්‍රියාව. ඒකට කියනවා **කෘත්‍යය ගුණය** කියලා. කෘත්‍යය ගුණය කියලා කියන්නේ චක්ඛු විඤ්ඤාණයට තිබෙන්නේ දැකීමේ කෘත්‍යය. ඒ දැකීමේ කෘත්‍යය වෙන කිසිම විඤ්ඤාණයකට කරන්න බෑ. දැන් අපි හිතමු යම්කිසි කෙනෙකුට බෑග් එකක් උස්සා ගන්න බෑ. එතකොට තව එක්කෙනෙක් කියනවා ‘මම ගෙනිහින් දෙන්නම්’ කියලා අරගෙන යනවා. අපි හිතමු මේ මහත්තයට වාහනය පදවන්න බෑ. එතකොට මහත්තයා කියනවා වෙන කෙනෙකුට වාහනය පදවන්න කියලා. එතකොට මහත්තයා වෙනුවෙන් වාහනය පදවන්න කෙනෙක් ඉන්නවා. ඔය වගේ සමහර ඒවා තිබෙනවා අපිට බැරි දෙයක් වෙනත් කෙනෙක් ලවා කරවා ගන්න පුළුවන්.

නමුත් චක්ඛු විඤ්ඤාණය බෑ සෝත විඤ්ඤාණයට කියන්න මම වෙනුවෙන් රූප ටිකක් බලලා එන්න කියලා කියන්න. එහෙම හුවමාරු කරගන්න බෑ. දැන් අපි හිතමු කෙනෙකුට බඩ ගිනි වෙනවා. එයාට යා ගන්නත් බෑ. එතකොට වෙන කෙනෙක් කියනවා ‘ඔයාට යන්නත් බෑ, නමුත් ඔයාට බඩගිනියි. ඔයා ගෙදර ඉන්න. ඔයා වෙනුවෙන් මම ගිහිල්ලා කාල එන්නම්’ කියලා. එහෙම හුවමාරු කරන්න පුළුවන්ද? ඒවගේම තවත් කෙනෙකුට තිබෙන වතුර පිපාසය වෙනුවෙන් වෙන එක්කෙනක් වතුර බොනවා වගේ දේවල් කරන්න බෑ. සමහර දේවල් වෙනත් කෙනෙකු වෙනුවෙන් කරන්න බෑ. ඒ දේවල් කරන්න ඒ අදාළ ක්‍රියාව අවශ්‍ය කෙනාට මිස වෙන කෙනෙකුට බෑ. **ඒවගේ සමහර ක්‍රියා නියතයි.**

1) දැකීමේ ක්‍රියාව - චක්ඛු විඤ්ඤාණයට නියතයි.
2) ඇසීමේ ක්‍රියාව - සෝත විඤ්ඤාණයට නියතයි.
3) අඝ්‍රාන ක්‍රියාව - ඝාණ විඤ්ඤාණයට නියතයි.
4) රස දැන ගැනීමේ ක්‍රියාව - ජිව්හා විඤ්ඤාණයට නියතයි.
5) ස්පර්ශ ක්‍රියාව - කාය විඤ්ඤාණයට නියතයි.

ඒක නිසා මේ පහ 'නියත වස්තුවක්' තිබෙන 'නියත අරමුණක්' තිබෙන 'නියත ක්‍රියාවල්' තිබෙන්නා වූ දේවල් පහක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ආඝ්‍රාණය රස දැනීම් සප්ර්ශ කිරීම කියලා කියන තුන විඳීමේ ක්‍රියාවල් නේද?

<u>පිළිතුර</u> - රස විඳිනවා සුවඳ විඳිනවා සැප විඳිනවා කියලා කියන එක මහත්මයා ධර්ම භාෂා නොවෙයි. ඒවා මේ එදිනෙදා පාවිච්චි කරන වචන. සුවඳ විඳිනවා කියලා කිව්වොත් රස විඳිනවා කියලා කිව්වොත් සැප විඳිනවා කියලා කිව්වොත් එහෙම නම් අපිට ගලපන්න ඕනෑ රූපත් විඳිනවා කියලා. සද්දත් විඳිනවා කියලා. ඒක මහතත්යා ලෞකික භාෂාව. ඒ ලෞකික භාෂාව මෙකට ගලපන්න බෑ.

දැන් හොඳට තේරුම් ගන්න මේකට නියත වස්තුවක් තිබෙනවා. නියත අරමුණක් තිබෙනවා. ඒවාට වෙන් වෙච්චම ක්‍රියාවක් තිබෙනවා.

දැන් මම පොඩි කාරණයක් කියනවා. අපි යම්කිසි රූපයක් බලනකොට ඒ රූපය බලන වෙලාවේ හිත තිබෙන්නේ කොහේද? එවෙලෙට හිත තිබෙන්නේ ඇහැට ඇවිල්ලා රූපයට වැදිලා, ඇහැ උඩට ඇවිල්ලා ඇහැ ඇතුලෙන් රූපයට වැදිලා. ඒ වෙලාවට හිත වෙන කොහේවත් නෑ, සෝත විඤ්ඤාණයකුත් නෑ, ඝාණ විඤ්ඤාණයකුත් නෑ. ජිව්හා විඤ්ඤාණයකුත් නෑ. කාය විඤ්ඤාණයකුත් නෑ. මොකක්වත් නෑ. ඒ වෙලාවට තිබෙන්නේ චක්ඛු විඤ්ඤාණය පමණයි. සෝත විඤ්ඤාණයට එන්න ඕනෑ නම් චක්ඛු විඤ්ඤාණය නැතිවෙලා ක්‍රියා විරහිත වෙන්න ඕනෑ. එතකොට තමයි වෙන විඤ්ඤාණයකට එන්න පුළුවන්. එකම වෙලාවට සෝත විඤ්ඤාණයයි චක්ඛු විඤ්ඤාණයයි දෙකක් එන්නේ නෑ. දෙකකට කරන්න බෑ. හැමවෙලේම එක්කෙනෙක් off වෙන්න ඕනෑ අනිත් එක්කෙනාට වැඩ කරන්න.

චක්ඛු විඤ්ඤාණයට වැඩ කරන්න ඇහැ කියන වස්තුව තිබෙනවා. සෝත විඤ්ඤාණයට කන තිබෙනවා. ඝාණ විඤ්ඤාණයට නාසය තිබෙනවා. ජිව්හා විඤ්ඤාණයට දිව තිබෙනවා. කාය විඤ්ඤාණයට ශරීරය තිබෙනවා. දැන් චක්ඛු විඤ්ඤාණයට අයිති තැන තමයි ඇස. සෝත විඤ්ඤාණයට අයිති තැන තමයි කන. එතකොට ඒවා තමන්ට අයිති rooms එක වගේ. දැන් මේ පස් දෙනාම එක වෙලාවකට කවදාකවත් වැඩ කරන්නේ නෑ.

නමුත් අපිට මේක තේරෙන්නේ නෑ. ඒක තේරෙන්නේ නැත්තේ වේගය නිසා. එකක් off වෙලා තමයි තව එකකට යන්නේ. මේවායේ තිබෙන පනින ගතිය වැඩි කම නිසා තමයි අපිට හිතෙන්නේ එක වෙලාවේම තුන හතරක් කරනවා කියලා. අන්න එහෙම එකක් තිබෙන්නේ. ඒක නොතේරුම් කම. නොදන්නා කම.

ඊළඟට අනිත් එක තමයි රූපයක් දැකපු ගමන්ම ඒක ගිහිල්ලා වදිනවා මනසේ. දැන් හැම එක්කෙනාම ෆොටෝ ගහනවා. ඒ ෆොටෝ එක ගත්ත ගමන් ඒ ෆොටෝ එක යන්නේ කොතැනටද? ඒක ඇතුලේ store වෙනවා. ඊට පස්සේ ඒ ෆොටෝ එක තිබෙන්නේ ඇතුලේ. ඉස්සෙල්ලා ගත්ත එක දැන් තිබෙන්නේ එතැන. ෆොටෝ එක ගන්න වෙලාවට කොහේද ඒක තිබෙන්නේ? ෆොටෝ එක ගන්නකොට එළියේ තිබෙන එක තමයි වද්දා ගන්නේ. හැබැයි ඒ එළියේ තිබෙන රූපය ගත්ත ගමන්ම storage වලට යනවා. ඊට පස්සේ අපි ෆොටෝ බලනකොට බලන්නේ එළියේ එකක්ද? ඇතුලේ එකක්ද? අපි බලන්නේ ඇතුලේ එකක්.

චක්ඛු විඤ්ඤාණය කියලා කියන්නේ ෆොටෝ එක ගහගන්නවා වගේ. ඊට පස්සේ ඒක store වෙනවා මනසේ. දැන් තවත් එකක් කියන්න ඕනෑ. ෆොටෝ එකක් ගහන වෙලාවට operate වෙන්නේ කැමරාවේ පොඩි මූණතයි. නමුත් අපි පස්සේ රූපය බලනකොට ඒකෙන් නොවෙයි බලන්නේ. අපි බලන්නේ storage එකේ. ඒවගේ චක්ඛු විඤ්ඤාණයෙන් රූප ගහගත්තා. ඒවෙලාවට හිත තිබෙන්නේ චකඛු වස්තුවේ, ඊට පස්සේ රූපය ගත්තු ගමන්ම හිත අස්සකට යනවා. ඒකට කියනවා **සම්පටිඡන** හිත කියලා.

ප්‍රශ්නය - Subconscious mind කියන එකද?

පිළිතුර - නෑ. Subconscious mind කියලා නෑ මහත්තයා. ඒවා බටහිර විග්‍රහයක්. බණේ subconscious නෑ. සාමාන්‍යයෙන් මිනිස්සුන්ට මේ ගැඹුරු දේවල් තේරෙන්නේ නැති නිසා ඒගොල්ලනටත් මේක කියලා මොන මොනවා හරි තේරුම් කරන්න ඕනෑ හින්දා හදා ගත්ත වචනයක්. ඕකට සිංහලෙන් කියන්නනේ යටි හිත කියලා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස දැන් අපේ චුති සිත ඊළඟ ආත්මයකට යනකොට අපේ කර්ම අපි අරගෙන යනවා. එතකොට ඒවා store වෙන්නේ කොහොද? හිතක කොහේ හරි තැන්පත් වෙලා තියෙන එකක්නේ ඔය යන්නේ. ඒකට මොකක්ද කියන්නේ?

පිළිතුර - දැන් අපිට හුරුවෙලා තියෙන්නේ යමක් එකතු කළොත් ඒක එතැන තිබෙන්න ඕනෑ කියලා. අපි ගබඩා කරපු මිනිස්සු. රෙදි අල්මාරියේ දාපු හාල් තුනපහ මුට්ටි වල දාපු මිනිස්සු. Store කරපු අය. ඒක හින්දා අපිට storage එකක් ගැන හිතෙනවා. දැන් බලන්න computer එකේ hard drive එකට අපි films දානවා ෆොටෝස් දානවා. Audio files දානවා. pdf දානවා තවත් තිබෙන ඔක්කෝම දේවල් දානවා. දාල ඉතින් ඔහේ තියනවා. දැන් බලන්න 32 Gigabyte pen drive එකක් පාවිච්චි කරන්න ඉස්සෙලා අපි කිරනවා. ඒක කිරුවහම අපි හිතමු තිබෙන්නේ බරගෑම් 50 යි කියලා. දැන් අපි ඒ Gigabyte 32 පිරෙන්නම දානවා නොයෙකුත් files. අපි හිතමු අපි ඒකට දානවා කියලා යකඩ වලින් ගහගන්න ඒවා, යුද්ධ කරන ඒවා, අවි ආයුධ තිබෙන ඒවා. එතකොට යකඩ කොහොමත් බරයි. එවගේම encyclopedia වගේ මහා විසාල බර පොත් දානවා. දැන් අපි ඒ pen drive එක පිරෙන්නම දාල ආයිත් කිරනවා. එතකොටත් තිබෙන්නේ ඒ බරමයි. එතකොට අපිට හිතෙන්නේ නැත්ද 'කෝ අර දාපු ඒවා' කියලා.

දැන් මේ කියන දේ අතිරේකයක්. අපි කියනවා download කරනවා කියලා. ඇත්තටම මොකක්ද download කරනවා කියලා කියන්නේ? ඒකට සිංහලෙන් කියන්නේ පහළට බාගන්නවා කියලා. එතකොට බලන්න ඇත්තටම download කරනවා කියලා කියන්නේ මොකක්ද කියලා. එහෙම මුකුත් පහළට එනවා පේනවද? Download කරනවා කියලා කියන එක සංඛ්‍යාන වැඩක්. දැන් මම මේක කියලා දෙන්නම්. මගේ computer එකක් තිබෙනවා. ඒකෙ සංඛ්‍යාන ගණන් කරලා ගණන් කරලා ගහන්න පුළුවන් කම තිබෙන්නේ ලක්‍ෂයයි. මම මේ ලක්ෂය ඉඩ තියාගෙන ඉන්නවා. දැන් මම ටයිප් කරන්න ටයිප් කරන්න වෙන්නේ මේකේ ඇතුලේ සංඛ්‍යා වදිනවා. එතකොට මම ලියුමක් ටයිප් කරනවා කියලා කියන්නේ සංඛ්‍යා දාහක් දෙදාහක් විතර වැටෙනවා. එතකොට අර ලක්ෂයෙන් ඒ ගණන අඩු වෙනවා. මම මේක පාවිච්චි කරන්නේ නෑ කියලා කියන්නේ සංඛ්‍යාන ලක්ෂයක ඉඩක් තිබෙනවා කියන එකයි.

දැන් වලාකුළු අස්සේ තිබෙනවා චන්ද්‍රිකාවක් - satellite එකක්. ඒවා හරහා තමයි අපිට මේවා ලැබෙන්නේ. අපි හිතමු එතැන ෆොටෝ එකක් තිබෙනවා. ඒක පිටිපස්සේ තිබෙනවා සංඛ්‍යාවක්. අපි හිතමු ඒක X1000 යි කියලා. දැන් ඒක මගේ computer එකේ නෑ. යම් කිසි විදියකින් ඒ X1000 මගේ computer එකේ තිබුණා නම් එකෙත් ඒ පින්තූරේ පේනවා. ඒක නිසා මම ඒක download

කරනවා කියලා කරන්නේ satellite එකත් එක්ක lineup කරනවා. එතකොට ඒකේ තිබෙන X1000 ට සමාන තවත් X1000 ක් computer එකේ හැදෙනවා. බින්දු ටිකක් වැඩි වෙලා වැඩි වෙලා ගිහිල්ලා satellite එකේ තිබෙන පින්තූරයේ තිබෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මගේ computer එකේ හැදෙනවා. එතකොට ඒක පේනවා. නමුත් මොකක්වත් එන්නේ නෑ. හැම වෙලේම වෙන්නේ satellite එකේ store වෙලා තිබෙන පිංතූරයට සමාන සංඛ්‍යාවක් computer එක ඇතුලේ හැදෙනවා. ඒකට කියනවා download කරනවා කියලා.

දැන් හිතන්න දිව්‍යක්ඥානය ගැන. දිව්‍යක්ඥානය පහළ උනහම දිව්‍ය ලෝක පේනවා. හැබැයි දිව්‍යක්ඥානය දෙන්න බෑ. දැන් තව එක්කෙනෙක් භාවනා කරලා භාවනා කරලා ඒ දිව්‍යක්ඥානය තිබෙන එක්කෙනාගේ සිතට සමාන සිතක් හදාගන්නවා. එහෙම හැදුවට පස්සේ අර ඉස්සෙල්ලා දිව්‍යක්ඥානය පහළ වූ කෙනාට පේන්නෙ යම්දෙයක්ද එයාටත් ඒ දේම පේනවා. නමුත් එයාගෙන් මොකුත් අනිත් කෙනාට ගියේ නෑ. ආන්න ඒ වගේ එකක් තමයි මෙතැනත් සිද්ධ වෙන්නේ.

දැන් මම කියන්නේ **සම්පටිඡන සිත** ගැන. චක්ඛු විඤ්ඤාණය පහළ වූ ගමන්ම **සම්පටිඡන සිත** කියලා එකක් පහළ වෙනවා.

1) චක්ඛු විඤ්ඤාණය = සම්පටිච්ඡනය - අනියත ආරම්මණය
2) සෝත විඤ්ඤාණය = සම්පටිච්ඡනය - අනියත ආරම්මණය
3) ඝාණ විඤ්ඤාණය = සම්පටිච්ඡනය - අනියත ආරම්මණය
4) ජිව්හා විඤ්ඤාණය = සම්පටිච්ඡනය - අනියත ආරම්මණය
5) කාය විඤ්ඤාණය = සම්පටිච්ඡනය - අනියත ආරම්මණය

දැන් මේ ‘චක්ඛු විඤ්ඤාණ’ ‘සෝත විඤ්ඤාණ’ ‘ඝාණ විඤ්ඤාණ’ ‘ජිව්හා විඤ්ඤාණ’ ‘කාය විඤ්ඤාණ’ යන මේ විඤ්ඤාණ පහ ඉවර වෙච්ච ගමන්ම පහළ වෙන සිත තමයි සම්පටිච්ඡනය. ඒකට කියනවා පිළිගැනීමේ හිත කියලා.

මේක පරෙස්සමෙන් තේරුම් ගන්න.

1) චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු රූපය store වෙන්නේ සම්පටිච්ඡනය සිතේ.
2) සෝත විඤ්ඤාණයෙන් ගත්තු ශබ්දය store වෙන්නේ සම්පටිච්ඡනය සිතේ.
3) ඝාණ විඤ්ඤාණයෙන් ගත්තු ගන්ධය store වෙන්නේ සම්පටිච්ඡනය සිතේ.
4) ජිව්හා විඤ්ඤාණයෙන් ගත්තු රසය store වෙන්නේ සම්පටිච්ඡනය සිතේ
5) කාය විඤ්ඤාණයෙන් ගත්තු ස්පර්ශය store වෙන්නේ සම්පටිච්ඡනය සිතේ.

දැන් මේ සම්පටිච්ඡන සිත කියන එක නියත ආරම්මණ තිබෙන එකක් නොවෙයි. චක්ඛු විඤ්ඤාණයට නියත ආරම්මණයක් තිබෙනවා. සෝත විඤ්ඤාණයටත් නියත වෙච්ච ආරම්මණයක් තිබෙනවා. නමුත් **සම්පටිච්ඡන සිතට නියත වෙච්ච ආරම්මණයක් නෑ.** ඒ සම්පටිච්ඡන සිතේ රූපත් register වෙනවා ශබ්දත් register වෙනවා. ගඳ සුවඳ - රස - සප්ර්ශත් register වෙනවා. ඒක නිසා මේ සම්පටිච්ඡන සිත කියන එක **අනියත ආරම්මණ** තිබෙන සිතක්.

දැන් පොඩ්ඩක් නැවතත් ආපස්සට යනවා. මේක හැමෝටම වැදගත් වෙනවා. බත් බෙදන්න පිඟානක් තිබෙනවා. තේ දෙන්න කෝප්පයක් තිබෙනවා. අයිස්ක්‍රීම වලට cone එකක් තිබෙනවා. Yogurt වලටත් cup එකක් තිබෙනවා. එතකොට ඒ ඒ අදාළ හැම දේකටම තිබෙනවා මොකක් හරි විශේශ භාජනයක්. Toffee Chocolate වගේ දේවල් වලට තිබෙන්නේ කඩදාසි. කවදාකවත්ම chocolate වළඳන්නේ නෑ පිඟන් වලට දාගෙන. කෝප්ප වලට දාගෙන කන්නේ බොන්නෙත් නෑ. ඒවාට තිබෙනවා පොඩි කොළයක්.

ඒ ඒ අදාළ දේට මොකක් හරි ආධාරකයක් තිබෙනවා. ඒවගේම පොල් මදයක් ගත්තත් ඒකටත් තිබෙනවා පොල් කට්ටක්. ස්වභාවයෙන්ම ඒකට තිබෙන්න දෙයක් හැදිලා තිබෙනවා.

දැන් මම කිව්වේ චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය යන විඤ්ඤාණ වලට නියත වස්තුවක් තිබෙනවා කියලා. ඒ විඤ්ඤාණ වලට ගිහිල්ලා හිට ගන්න base එකක් තිබෙනවා. එතකොට අපිට හිතෙනවා මේ මනෝ විඤ්ඤාණයට ඒවගේ එකක් නැතුව ඇති කියලා. නෑ, මනෝ විඤ්ඤාණයටත් ඒ වගේම ඉන්න වස්තුවක් තිබෙනවා. ඕක කට්ටියට දැන් හොයා ගන්න බැරුව ඉන්නේ.

දැන් ඉස්සෙල්ලා කියපු වස්තු වලට කිව්වා 'චක්ඛු ප්‍රසාද' 'සෝත ප්‍රසාද' 'ඝාණ ප්‍රසාද' 'ජිව්හා ප්‍රසාද' 'කාය ප්‍රසාද' කියලා. නමුත් ඇසෙන් නාසයෙන් කනෙන් දිවෙන් ශරීරයෙන් අරමුණු ගන්නේ නැතුව හිතන්නේ නැතුව ඉන්න තාක්කල් හිතට (මනෝ විඤ්ඤාණයට) ගුලිවෙලා ඉන්න තැනක් තිබෙන්න ඕනැ. ඒ මනෝ විඤ්ඤාණයට ඉන්න තිබෙන තැනට කියනවා 'වස්තු රූපය' කියලා. සමහර තැන් වල කියනවා 'හෘදය වස්තු රූපය' කියලා. ඒක හරිම සියුම් දෙයක්.

ඉස්සර කාලේ මිනිස්සු ඕකට කිය කියා හිටියා හෘදය වස්තුව ආශ්‍රයේ තිබෙනවා කියලා. ඊට පස්සේ විද්‍යාවෙන් එහෙම වෙන්න බෑ කියලා හොයාගෙන ඊට අපස්සේ කිව්වා brain එකේ තිබෙනවා කියලා. ඊට පස්සේ පරීක්ෂණ කරලා කරලා ඒකෙනුත් තේරුම් ගත්තා එතනත් එහෙම එකක් හොයා ගන්න බෑ කියලා. නැවතත් දැන් වැඩිපුර අය කියනවා heart එකේ තියෙනවා කියලා. ඇත්තටම heart එකයි brain එකයි කියන්නෙන් muscles දෙකක්. Heart එකේ තිබෙන්නේ රබර් වගේ තිබෙන හයිය ගතියක්. Brain එකේ තිබෙන්නේ ජෙලී ස්වරූපයෙන් ටිකක් ගොරෝසුවට තිබෙන්නා වූ curly muscles ටිකක්. මම දැකලා තිබෙන හැටියට heart එක තරම් හයිය නෑ brain එක.

මම මිනී පුච්චනවා බලන්න ගියා බුරුමේ. එහෙ වැඩ ඉන්න කාලෙක අපිට ආරධනාවක් ආව මිනි දවනවා බලන්න එන්න කියලා. හාමුදුරුවරු වටේම හිටියා. වලක් කපලා දර අහුරලා කඩදාසි වලින් හදාපු පෙට්ටියක මිනිය ගෙනල්ලා මූණින් අතට දැම්මා. එහෙ දාන්නේ මූණින් අතට. ඊට පස්සේ ඒකට උඩින් ටයර් කැල්ලක් දැම්මා. ඊට පස්සේ දර දාලා ගින්දර දැම්මා. ඊට පස්සේ අර මිනී පෙට්ටිය වගේ තිබ්ච්ච කොළ ටිකත් ඒකට දැම්මා. දැන් ටික වෙලාවක් යනකොට ඒක ටයර් එකක් පිච්චෙනවා වගේ ගිනි ගත්තා. මම හිතුව මේකේ ඇටකටු එහෙම පිච්චෙන්න වෙලා යයි කියලා, අනිත් ඒවානම් ඉක්මනට කරවෙලා යනනිසා. නමුත් ඇට කටුත් පිච්චුනා හිස් කබලත් පිච්චුනා. නමුත් අවසානයේදී heart එක ඉතුරු උනා. ඒක පුච්චන්න ගොඩක් වෙලා ගියා. ඒක රබර් එක වගේ. ඒ මළ කඳේ අවසානයටම පිච්චුනේ heart එක. ඒ අය කිව්වා ඒක එහෙම වෙනවා කියලා. ඒක මස් නිසා ඉක්මනට පිච්චිලා යනවා කියලා හිතුවට එහෙම නෑ. ඊට පස්සේ ඒක උණ ලීයක බැඳලා අඟුරු එකතු කරලා පිච්චුවා. ඔහොම එකක් උනා.

ඉතින් මේ සම්පටිච්ඡන හිත කියලා කියන්නේ එළියට යන හිතක් නොවෙයි. ඒක ඇතුලේ හිතක්. මේ සම්පටිච්ඡන හිතට ක්‍රියාත්මක වෙන්නේ base එකක් අවශ්‍යයි. වස්තුවත් අවශ්‍යයි. ඒක තමයි වස්තු රූපය හෙවත් හෘදය වස්තු රූපය. ඒ හෘදය වස්තු රූපයේ උඩ ඉඳගෙන තමයි සම්පටිච්ඡන සිත අර අරමුණ store කරගන්නේ.

<u>ප්‍රශ්නය</u> - ඔය කියන subconscious කියන එක ඒකට හා සමානයි ද?

<u>පිළිතුර</u> - Subconscious කියන්නේ ඕකත් නොවෙයි මහත්තයා. ඒ වචනය පාවිච්චි කරලා තිබෙන්නේ 'මතකය' නිසා. දැන් මේ වෙලාවේදී අපි අරමුණු කරන්නේ මම කියන කථා ටිකයි ඔය සිතන සිතුවිලියි පමණයි. එතකොට තිබෙන්නේ active mind එකක්. එතකොට දැන් උඩට ඇවිල්ලා තිබෙන්නේ අපි කථා කරන ටික. තව ඉතින් අපි කරපු කියපු දේවල් ඔක්කොම මතක නැති වෙලා තිබෙනවානේ. ඒ ටික යම්කිසි වෙලාවක පොතකින් පතකින් හරි අපි මතක කරලා ගන්නවා. එතකොට මතක් වෙලා එනවා. ඒ

මතක් වෙලා එන වෙලාවට උලුප්පලා හාරලා ගන්න දෙයක් තිබෙන්න ඕනෑ. ආන්න ඒක කෙනෙකුට කියලා දෙන්න තමයි ඔය subconscious mind එකක් තිබෙනවා කියලා කියන්නේ.

ඇත්තටම ධර්මය අනුව subconscious එකක් නෑ.

<u>ප්‍රශ්නය</u> - එතකොට ඒවා store වෙන්නේ සම්පටිඡන සිතේද?

පිළිතුර - නෑ, මේකේ තිබෙනවා මහත්තයා connection එකක්. මේක මෙන්න මෙහෙම මම කියන්නම්. ලී කොටයක් තිබෙනවා. ඒ ලී කොටේ කැපුවොත් ඒකෙන් පුළුවන් පුටුවක් හදන්න. එතකොට පුටුවක් හැදීමේ ගතිය ශක්තිය ඒකේ තිබෙනවා නේද? දැන් අපි හිතමු පුටුවක් හදන්නේ නැතුව ඇඳක් හදනවා කියලා. ඒ කියන්නේ ඒකේ තිබෙනවා ඇඳක් හැදීමේ ගතිය. එහෙම නැත්නම් හදන්න බෑ. ඊළඟට අපි හිතමු ඇඳ හදන්නෙත් නෑ පුටුවක් හදන්නෙත් නෑ මේසයක් හදනවා කියලා. ඒ කියන්නේ මේසයක් හැදීමේ ගතියත් එකේ තිබෙනවා. එහෙම නැත්නම් අපි හිතනවා අපි trays හදනවා කියලා. ඒ කියන්නේ trays හැදීමේ ගතියත් ඒකේ තිබෙනවා.

දැන් බලන්න ඒ කොටයෙන් පුටුවක් හදා ගැනීමේ හැකියාව තිබෙනවා, ඇඳක් හදා ගැනීමේ හැකියාව තිබෙනවා. මේසයක් හදා ගන්න tray එකක් හදාගන්න පුළුවන් ගතිය තිබෙන්නේ ඒ ගතිය ඒ කොටයේ තිබෙන නිසා. ඒ වගේ යම් කිසි දෙයක් ගත්තම ඒ දේ ඇතුලේ අපිට ඕනෑම දෙයක් හදා ගැනීමේ නිර්මාණය කර ගැනීමේ ලක්ෂණය ගුණ ස්වභාවය එකේ ඇතුලේ කැවිලා තිබෙනවා. නමුත් අපිට පේන්නේ කොටේ විතරයි. හැබැයි කරගන්න පුළුවන් ඔක්කොම එකේ connect වෙලා තිබෙනවා. ආන්න ඒ වගේ දැනට තිබෙන්නේ මේ ක්‍රියාත්මක වෙන හිත විතරයි. නමුත් ඒකට ඉස්සෙල්ලා දාපු ඔක්කොම connect වෙලා තිබෙනවා. Storage එකක් කියලා කියන්නේ නෑ. ඒක හරියට කියනවානම් මෙහෙමයි.

අපි හිතමු අවුරුදු පහක ළමයෙක් හෝඩිය පන්තියට යනවා. හෝඩියේ පන්තියේ උගන්නවා අ, ආ, ඇ ඈ වගෙ අකුරු. මේ හෝඩිය පන්තියේ උගන්වන අකුරු වල ලියුම් ලිවීමේ හැකියාව තිබෙනවා. පොත් කියවීමේ හැකියාව, දේශන පැවැත්වීමේ හැකියාව, ඒවගේම රාජකාරි ලියුම් ලිවිමේ හැකියාව, අම්මට ලියුම් ලියන ගතිය යන මේ ඔක්කොම මේකේ අස්සේ තිබෙනවා. දැන් මෙයා අවුරුදු 20 විතර දරුවෙක් උනහම අපි 'ඔයා අර කාඩ්ස් ඇරියා, ලියුම් ඇරියා මේ විදියට banners ගැහුවා, ඔය banners ඔයාගේ හිත අස්සේ කොහේද තියෙන්නේ' කියලා කිව්වොත් එහෙම එකක් නෑ. ඒ ඔක්කෝම ටික තිබෙන්නේ අර ඉස්සසෙල්ලා ඉගෙන ගත්තු අකුරු වල.

ඒවගේ මේ වෙලාවට තිබෙන හිතේ ඒවට connection එකක් තිබෙනවා. ලී කොටයක් ගත්තහම ඒ ලී කොටේ පුටු හැදීමේ ගතියයි ඇඳන් හැදීමේ ගතියයි tray හැදීමේ ගතියයි ඔක්කෝම තිබෙනවා. නමුත් අපිට ඕනෑ වෙලා තිබෙන්නේ එහෙම නොවෙයි. අපිට ඕනෑ වෙලා තිබෙන්නේ ඒ ඇඳන් ටික කොටේ අස්සේ වෙන වෙනම කොහොමද තිබෙන්නේ කියලා දැනගන්න. මේක උදාහරණයක්.

<u>ප්‍රශ්නය</u> - එතකොට පහුගිය ආත්මවල ඒවත් store වෙලා තිබෙන්නේ මේ හිතේ?

<u>පිළිතුර</u> - ඒවා ඔක්කොම තිබෙන connection එකක් තිබෙනවා. ඕනෑ වෙලාවට ගන්න පුළුවන්.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස ඒක ශක්තියක් කිව්වොත් වැරදිද?

පිළිතුර - ශක්තියක් කියලා කියන්න පුළුවන්.

අපේ හිත් වස්තු මූලිකයි. වස්තු මූලිකයි කියලා කියන්නේ අපිට ශක්ති පිළිබඳව හිතා ගන්න අමාරුයි. පේන්නෙත් නෑ, දැන් බලන්න electricity වල තිබෙන හැකියාව, අපි හිතන්නේ නැනේ. දැන් බැටරියකට තිබෙන energy වලට තිබෙනවා torch එකක් දැල්වීමේ හැකියාව. රේඩියෝ එකක් play කිරීමේ හැකියාව. Fan එකක් කර කවන්න තිබෙන හැකියාව. තව නොයෙකුත් දේවල් කරන්න පුළුවන් හැකියාව

තිබෙනවා. එතකොට අපිට හිතෙනවා කොහොමද මේ බැටරිය මේවා වැඩ කරවන්නේ කියලා. 'කෝ ඒ' ගතිය කියලා අපිට හිතෙනවා. අපිට ඕනෑ හැමවෙලේම වෙන වෙනම වෙන වෙනම ඒ ගතිය තියෙන්නේ කොහේද කියලා දැන ගන්න. අපිට ශක්තිය කියන එක හිතට වද්දා ගන්න හරි අමාරුයි. ඒවගේ එකක් තමයි අපි මේ හිතට සම්බන්ධ කරලා storage කොහෙද කියලා බලන්නේ. එහෙම storage එකක් තිබෙනවා කියලා ලෝකයට කියා ගන්න ඕනෑ නිසා යම් කිසි කෙනෙකුට තේරෙන්න බෑග් එකක් හරි මොකක් හරි දෙයක් තියෙනවා කියන්න පුළුවන්. නමුත් ඇත්තටම එහෙම නෑ.

දැන් අකුණු ගැහුවහම මේවා ඔක්කොම කඩාගෙන බිඳගෙන යනවා. එතකොට අපි ඇහුවොත් වලාකුළුවල ඒ ශක්තිය කෝ කියලා. මෙච්චර ලොකු දේවල් දොරවල් ගොඩ නැගිලි කඩන්න පුළුවන් බිඳින්න පුළුවන් ගතිය කෝ කියලා ඇහුවොත් එකේ නෑ. බලයක් විතරයි තිබෙන්නේ. ඒවගේ දැනට තිබෙන්නා වූ මේ හිතේ තිබෙනවා එහෙට මෙහෙට පෙරලීයන ගතියේ මූලාශ්‍රය. එච්චරයි තිබෙන්නේ. ඒක තමයි අවස්ථාව ආපු ගමන්ම ක්‍රියාත්මක වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - දැන් ඒ හැකියාව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙන ගතියක්ද තිබෙන්නේ? හිත දියුණු කරගෙන යනකොට ඒ හැකියාව වෙනස් වෙනවද?

<u>පිළිතුර</u> - වෙනස් වෙනවා. ඒක මෙහෙමයි, දැන් නිදි සැපයත් හැම එක්කෙනාටම එකවගේ වෙන්නේ නෑ. මනුස්ස ලෝකයේ කෙනෙක් නිදාගන්න කොට එයාට නින්ද යනවා ආකාර නමයකට.

දැන් අපි උපදින වෙලාවට තිබෙනවා ප්‍රතිසන්ධි සිතක් කියලා එකක්. අපි 9 දෙනෙක් මේ මනුස්සලෝකයේ ඉපදුනොත් පින්කම් කරලා අපි නම දෙනාගේම ප්‍රතිසන්ධි සිත් එක හා සමාන වෙන්නේ නෑ. ඒක 9 ආකාරයටයි වෙන්නේ.

එතකොට දැන් මම **සෝමනස්ස සහගත ඤාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිතින්** උපදිනවා. ඒක හරිම සෞම්‍ය වෙච්ච මෘදු වෙච්ච කර්ම බලය වැඩිය තිබෙන හිතක්. ඊට පස්සේ ඒ ප්‍රතිසන්ධි හිත තමයි මට භවාංග සිත හැටියට පවතින්නේ.

ඊට පස්සේ තව කෙනෙක් උපදිනවා **සෝමනස්ස සහගත ඤාන සම්ප්‍රයුක්ත සසංඛාරික** සිතින්. එතකොට එයාට භවාංග හිත වෙන්නේ ඒ ප්‍රතිසන්ධි සිත.

තව එක්කෙනෙක් **උපේක්ෂා සහගත සිතකින්** උපදිනවා. එයාට භවාංග හිත වෙන්නේ ඒ ප්‍රතිසන්ධි සිත. එතකොට අපි දැන් සිත් 8 කින් මනුස්ස ලෝකයට ආවා. අපි වර්ග 8 ක සිත් වලින් ප්‍රතිසන්ධිය ගත්තා. එතකොට අපිට භවාංග සිත් තිබෙන්නේ වර්ග 8 ක භවාංග සිත්. අපි ඔක්කෝගෙම භවාංග සිත් එක වගේ වෙන්නේ නෑ. එතකොට 9 කියලා කිව්වේ **උපේක්ඛා සහගත සන්තීරණ සිතක් තිබෙනවා කුසල විපාක** ඒකෙන් මනුස්ස ලෝකයේ උපදිනවා. යම්කිසි කෙනෙක් මනුස්ස ලෝකයේ **කුසල විපාක උපේක්ඛා සහගත සන්තීරණ** සිතෙන් ඉපදුනොත් එයා එන්නේ වෙනම අහේතුක සිතකින්. එතකොට ඇස් පේන්නේ නැති කථා කරන්න බැරි deform අය උපදින්නේ ඔන්න ඔය සිතින්. ඒ අය මනුස්ස ලෝකයට ආවා නමුත් ඒ ආවේ හොඳ හයිය තිබෙන සිතකින් නොවෙයි. හරි පොඩි බාල පිනකින් මනුස්ස ලෝකයට ගොඩ උනා විතරයි. එයාගේ භවාංග සිත තමයි **කුසල විපාක උපේක්ඛා සහගත සන්තීරණ සිත**. දැන් නම දෙනෙක් ඉපදුනා. ඒ නම දෙනාගේ භවාංග සිත් නමයක්. ඒ සිත්වල තිබෙන්නේ බල නමයක්.

යම් කිසි කෙනෙක් නිදාගන්නවා කියලා කියන්නේ ඒ කෙනා උපත්තිය අවස්ථාවේදී ලබාගත්තු ප්‍රතිසන්ධි සිතට සමාන භවාංග සිතකට යනවා කියන එක. එහෙම ගිහිල්ලා පැයක් දෙකක් තුනක් ඉන්නවා. ඉන්නවා කියලා කියන්නේ ඒ භවංග සිතේ තමයි ඒ වෙලාවේ ඉන්නේ. ඒ භවාංග සිතට වෙලා ඉන්න එකට ලෝකයේ වචනයෙන් කියනවා නිදා ගන්නවා කියලා. ඒ කියන්නේ බාහිර ලෝකයට යොමුවෙලා තිබෙන active mind එකෙන් අයින් කරලා භවාංග ගිහිල්ලා හේත්තු කරලා තියනවා. එතකොට දැන්

අපි පැයක් නිදාගෙන හිටියා කියලා කියන්නේ භවාංග සිත්වල හිටියා කියන එක. ඊළඟට එළියට ඇවිල්ලා වටපිටාවට යොමුවෙනවා.

එතකොට අපි හොඳ හිතකින් සෞම්‍යය සිතකින් පින් සිතකින් මනුස්ස ලෝකයේ ඉපදුනා නම් ඒ සිත තමයි පස්සේ අපිට භවාංග සිත් වෙන්නෙත්. ඒ සිතම තමයි නින්දට ගිහිල්ලා අත් විඳින්නෙත්. ඒක ඒ තරමට සියුම්, ඒ තරමට ශාන්ත සෞම්‍ය සිතක්. ඒවගේ අයට වැඩි වේලාවක් නිදා ගත්තේ නැතුවාට කමක් නෑ. ඒ තරම්ම බලවත් ඕජා සම්පන්න සිතක්. පොඩි වේලාවක් නිදාගත්තත් ඒ සිත refresh වෙනවා පුදුම විදියට.

දැන් අපි ඔය නම දෙනා එක ශාලාවක නිදි කරනවනවා. ඒ නම දෙනාටම නින්ද යනවා. දැන් ඒ නින්ද ඉන්නේ භවාංග සිත් නමයක. ඒ අය නැගිටිනවා. නැගිටින්නේ ආකාර 9 යකට. සමහරු ඇඟ මැලිකඩ කඩා නැගිටිනවා, හිත් බලවත් අය ප්‍රසන්න විදියට නැගිටිනවා. පිං සිත් බලවත් අයගෙ ඒ සිත් හරි සෞම්‍යයයි ඒ වගේම බලවත්. ඒ අය ටික වෙලාවකින් නැගිටිනවා. සමහරු ඔය භවාංග සිතට වෙලා ඒකට කිඳා බැහැලා ඔහේ ඉන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි දැන් භාවනා කරලා කුසල් සිත් වැඩි කරගත්තොත් එතකොට භවාංග සිත ශක්තිමත් වෙනවා නේද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - නෑ, දැන් අපි මනුස්සලෝකයට එනකොට අපේ භවාංග සිත තීරණය වෙන්නේ අපි මෙහෙ කරන ඒවගෙන් නොවෙයි. පෙර ආත්ම වල කරපු ඒවගෙන්. මෙහෙ කරන ඔක්කෝම ටික මීට පසු එකකට මිසක් ඒවගෙන් මේක change කරන්න බෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් කිව්වනේ භවාංග සිත ප්‍රමෝදමත් උනහම තමයි හොඳට නැගිටින්නේ කියලා?

<u>පිළිතුර</u> - භවාංග සිත ප්‍රමෝදමත් උනහම කියලා කියන්නේ ප්‍රමෝදමත් වූ භවාංග සිතක් හැදිලා තිබෙන අයට නින්ද සැපයි, ටිකයි අවශ්‍යය.

බුදුරජාණන්වහන්සේ දවසකට විවේක ගන්නේ පොඩි වෙලාවයි. **හේතුව බුදුරජාණන් වහන්සේ මවුකුසේ උප්පත්තිය ලබපු අවස්ථාවේදි උන්වහන්සේට ලැබිලා තිබෙන පිං සිත සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික මෛත්‍රී පූර්වාංගම සිතයි.** ඒක නිසා බුදුරජාණන්වහන්සේට පොඩි වේලාවක් සැතපුනහම හොඳටම හොඳයි. වැඩි වෙලාවක් අවශ්‍ය නෑ. භවාංග සිත් මෙහෙ ඇවිල්ලා හදන්න බෑ. ඒක එහෙමමයි.

දැන් මේ ලෝකයේ අපි දන්නවනේ වෙච්ච දේ. නිදාගන්න යනකොට නින්ද යන්නේ නෑ අමාරුයි. එහෙම ඒවා තිබෙනවා. එතකොට නිදාගන්න ගියහම කොච්චර දුකක්ද නින්ද යන්නේ නැති එක. නිදාගත්තොත් ඇහැරෙන්නේ නෑ. ඇහැරුනොත් පන නෑ. ඒක නිසා ඔය ටික තේරුම් ගන්න. ඔය ටික තේරුම් අරගෙන ඊළඟ ජීවිතකයවත් හොඳට නිදා ගන්න නම් මෙහෙ පින් කරන්න.

<u>ප්‍රශ්නය</u> - දැන් ස්වාමීන්වහන්ස භාවනා කරගෙන හිටියහමත් නින්ද යන්න වෙලා යනවා වගේ එකක් තියෙනවා නේද?

<u>පිළිතුර</u> - වෙන්න පුළුවන්. ඒක වෙන්නේ මෙහෙමයි. ශරීරය active උනහම නින්ද යන්නෙත් නෑ. muscles cool down වෙන්න ඕනෑ. ඒවගේම energy drinks කෑම බීම කෝපි වගේ ඒවා ගත්තමත් ශරීරය ready නැති නිසා එහෙම වෙන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට මෛත්‍රී භාවනාවේ සැපට නින්ද යනවා කියලා ආනිසංසයක් තියෙනවා නේද?

<u>පිළිතුර</u> - ඔව් ඒක ආනිසංසයක් තමයි. ඒ කියන්නේ යක්ෂ භූත ප්‍රේත ආදී කොටස් පේන්නෙ නැතුව බයක් තැති ගැනීමක් නැතුව අතර මග කැඩෙන්නේ නැතුව සැපට නින්ද යනවා. හිතා ගත්ත වෙලාවට ඇහැරෙනවා. ඒ කියන්නේ භවාංග වෙනස් උනා කියන එක නොවෙයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට වයසට යනකොට ඇයි වරින් වර නින්ද යන්නේ නැතුව තිබෙන්නේ?

<u>පිළිතුර</u> - එකක් තමයි ඇඟේ තිබෙන රූපවල වෙනස් කම්. වැඩිය මහන්සියක් වෙන්නෙත් නෑ. ඒකයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස නිවන් දකින්න මේ ටික ඔක්කොම ඉගෙන ගන්න ඕනෙද? නැත්නම් භාවනා කරහම ඔය ටික ඔක්කොම එනවද?

<u>පිළිතුර</u> - භාවනා කිරීම වටිනවා, භාවනා කිරීම තුල ධර්ම අත් විඳ විඳ අත් විඳ විඳ යනවා. යම්කිසි දෙයක් ඉගෙන ගැනීම තුල සුතමය ඥානය වැඩි වෙනවා භාවනා කිරීම ලේසි වෙනවා. දැන් අපි හැම එක්කෙනාගේම දෘෂ්ඨි කැවිලා තිබෙනවා. ආත්ම දෘෂ්ඨිය සාස්වත දෘෂ්ඨිය ආදී දේවල් තදේට කැවිලා තිබෙනවා. ඉගෙන ගන්න එක්කෙනා හෝ භාවනා කරන එක්කෙනාට කරන්න ඕනෑ වෙන්නේ ඒ දෘෂ්ඨි කඩා ගැනීම. එතකොට යම්කිසි කෙනෙක් භාවනා කරගෙන යනකොට ඒක හරියට මෙහෙමයි.

වෙලිංටන් ගිහිල්ලා නැති එක්කෙනෙක් වාහනයක් අරගෙන මෙහෙ ඉඳලා එහෙ යනවා. එහෙම යනකොට සමහර හන්දි වලින් කොහෙටද හැරෙන්නේ කියලා සැක සහගතයි. බෝඩ් බලනවා හැම තැනම විපරම් කරනවා, එයාට තහවරු කරගන්න. නැත්නම් එයා කාගෙන් හරි අහනවා, නැවත හොයලා බලනවා. නවත්වනවා. එහෙම උනහම අතරමගදී නැවති නැවතී හොය හොයා බල බලා තමයි යන්න වෙන්නේ. සමහර වෙලාවට වැරදි පාරවල් වල ගිහිල්ලා ආපහු ඇවිල්ලා හරවලා යනවා. ඒ වෙන්නේ එයා පාර දන්නේ නැති නිසයි. දන්නේ නැති පාරක ඒ දිසාවට හොයාගෙන හොයාගෙන යනවා.

තවත් කෙනෙක් ඉන්නවා එයා ගිහිල්ලා නැති උනත් එයා ඉස්සෙල්ලාම road map එක කියවනවා. එයා තහවරු කරගන්නවා කිලෝමීටර් මෙච්චර ප්‍රමාණයකින් මේ නගරය හම්බ වෙනවා. මෙච්චර ප්‍රමාණයකින් හැමිල්ටන් හම්බවෙනවා . ඊට පස්සේ city එකට යන්නේ නැතුව ගියොත් මෙහෙමයි city එක මැදින් ගියොත් මෙහෙමයි කියලා පාර හොඳට study කරනවා. ඊළඟට බලනවා මෙතැන ගඟක් තිබෙනවා, මෙතැන farms තිබෙනවා කියලා ඒවත් හඳුනා ගන්නවා. ඊට පස්සේ Taupo යනවා, එහෙ lake එකක් තිබෙනවා කියලා ඒ ඔක්කොම map කරගන්නවා. එතකොට මෙයා ඉස්සෙල්ලාම map එක study කරලා තිබෙන්නේ. ඉතින් මෙයා යනකොට එයාට නවත්ත නවත්ත යන්න ඕනෑ නෑ එයා map එකේ කියෙව්ව නිසා 'මේ තියෙන්නේ ගඟ මේ තියෙන්නේ lake එක' කියලා තහවරු වෙනවා. 'මේ මම කියවපු එක තමයි මේ තිබෙන්නේ' කියලා හොඳට වැටහෙනවා. ආන්න ඒක නිසා යන්න ලේසියි. මග සැක හැදෙන්නේ නෑ. අන්න ඒක තමයි සුතමය ඥානය ප්‍රයෝජනවත් වෙනවා කියන්නේ.

හොඳයි තෙරුවන් සරණයි සැම දෙනාටම ධර්ම අවබෝධය වේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි